# ඥානය පිළිබඳ ග්‍රීක දාර්ශනිකයින්ගේ මතවාද

කිරම විමලතිස්ස හිමි

බටහිර දර්ශනය තුළ පැණෙන ප්‍රධාන දාර්ශනික ක්ෂේත්‍රයක් වශයෙන් ඥාන විභාගය (epistemolgy) හැඳින්විය හැකිය. මිනිස් ඥානය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කිරීම ඥාන විභාගයේ ප්‍රධාන අපේක්ෂාවයි. මෙහිදී දැනුම යනු කුමක් ද, නිවැරිව දැනුම ලබාගන්නේ කෙසේද, අප ලබාගන්නා දැනුම කෙතෙක් දුරට නිරවද්‍ය ද, මිනිස් ඥානයේ සීමාව කුමක් ද වැනි දැනුම හා සම්බන්ධ විවිධ ක්ෂේත්‍රයන් පුළුල් ලෙස සාකච්ඡාවට ලක් කෙරේ. අපරදිග දර්ශනයේ ආරම්භක සමයේ සිටම ඥානය සම්බන්ධයෙන් විවිධ අදහස් ඉදිරිපත් විය. බටහිර දර්ශනයේ කේන්ද්‍රස්ථානය ග්‍රීසිය යැයි සැලකූවිට ඉන් පසුව ක්‍රමයෙන් දර්ශනය නැමති විෂයය ව්‍යාප්ත වත්ම යුගයෙන් යුගය බිහිවූ විවිධ දාර්ශනිකයින් විසින් 'දැනුම' සම්බන්ධයෙන් ඉදිරිපත් කළ අදහස් මධ්‍යතන, නූතන හා සමකාලීන යුගවල දී සාකච්ඡාවන්ට ලක් කර ඇත. මෙහි දී උත්සාහ කරන්නේ ග්‍රීක යුගයේ විසූ දාර්ශනිකයින් විසින් 'ඥානය' සම්බන්ධයෙන් දැක්වූ අදහස් විමසුමට ලක් කිරීමටය. ඒ අතරින් ද සොක්‍රටීස්, ප්ලේටෝ හා ඇරිස්ටෝටල් යන දාර්ශනිකයින්ගේ අදහස් කෙරෙහි වැඩි අවධාය යොමු කරනු ලැබේ.

ග්‍රීක දර්ශනයේ ආරම්භකයා වශයෙන් සැලකෙන්නේ ග්‍රීසියේ විසූ තේල්ස් ය. ඔහු විසින් ක්‍රි.පූ. 585 දී සූර්යග්‍රහණයක් පිළිබඳ අනාවැකියක් පැවසීම මානව ඉතිසාහය තුළ සිදු වූ සුවිශේෂී පරිවර්ථනයක් ලෙස විද්‍යාඥයෝ සලකති. මේ තුළින් ආකාශ වස්තූන් කිසියම් රිද්මයකට භ්‍රමණය වීම පිළිබඳ සිද්ධාන්තය අනාවරණය විය. මීට අමතරව තේල්ස් ඉදිරිපත් කළ වැදගත් මතයක් නම් ලෝකය ජලයෙන් නිර්මාණය වී ඇති බවයි. මේ අකාරයට දර්ශනයට ඇවැසි බුද්ධිමය පදනමක් බිහි කළ තේල්ස් ඉන් පසුව බිහිවූ ග්‍රීක දාර්ශනිකයන්ට පූර්වාදර්ශයක් විය. මින් පසුව **ඇනැක්සිමැන්ඩර්, ඇනැක්සිමිනිස්, ඩිමෝකීටස්, එම්පිඩෝක්ලීස්, හෙරක්ලිටස්** වැනි දාර්ශනිකයන් ද තේල්ස් අනුගමනය කරමින් විශ්වය පිළිබඳව විවිධ මත ඉදිරිපත් කළ අයුරු දැකගත හැකිය. මේ අතර වඩා වැදගත් වන කරුණක් නම් පරමාණු සංකල්පය බිහි වූයේ මේ යුගයේ වීමයි. එය මුලින්ම දැක්වූයේ ඩිමොකීටස් ය. ඔහුට අනුව ලෝකය සෑදී ඇත්තේ ඇසට ගෝචර නොවන එහෙත් නිරන්තරයෙන් චලනය වන කුඩා අංශු

විශේෂයකිනි. තාක්ෂණය අතින් නොදියුණු යුගයක මෙවැනි අදහස් ඉදිරිපත් කිරීම විශ්මිත වූවක් බව ඇතැම්හු දක්වති. මෙසේ විශ්වයේ ඥාන ගවේෂණය සඳහා දර්ශනය මෙහෙයවමින් තිබූ යුගයක එම ගමන් මග වෙනස් කොට මිනිසා පිළිබඳ යථාර්ථයන් අධ්‍යයන කිරීම සඳහා දර්ශනය යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කළේ **සොක්‍රටීස්** නම් මානව හිතවාදී දාර්ශනිකයා විසිනි. ඔහුගේ අදහස වූයේ දර්ශනය පැවතිය යුත්තේ අධිභෞතික කරුණු ගවේෂණය සඳහා නොව මිනිසා පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා බවය. මේ නිසා අධිභෞතික දේ සම්බන්ධයෙන් පැවති දර්ශනය වෙනස් කොට මිනිසා පිළිබඳ කරුණු ගවේෂණය සඳහා දර්ශනය මෙහෙයවීමේ ගෞරවය හිමිවනුයේ සොක්‍රටීස්ටය. සොක්‍රටීස්ගේ මෙම පෙළඹවීම නිසා මින් පසුව බිහි වූ **ප්ලේටෝ** හා **ඇරිස්ටෝටල්** වැනි දාර්ශනිකයින් ද මිනිසා පිළිබඳව දාර්ශනිකව කරුණු ගවේෂණයට වැඩි අවධානයක් යොමු කළේය. එහෙත් මෙම යුගය දර්ශනයේ ආරම්භක සමය බැවින් පසුකාලීනව දාර්ශනික ක්ෂේත්‍රය තුළ දක්නට ලැබෙන ඥානවිභාගය, ආචාරවිද්‍යාව, තර්ක ශාස්ත්‍රය වැනි වෙන් වෙන් වූ අධ්‍යයන ක්ෂේත්‍ර දැක ගත නොහැක. ආරම්භයේ දී සියල්ල පැවතියේ සම්මිශ්‍රණයක් වශයෙනි. එබැවින් ඥාන විභාගය සම්බන්ධයෙන් ග්‍රීක දර්ශනය හදාරන විද්‍යාර්ථීන් විසින් ඔවුන්ගේ දාර්ශනික ඉගැන්වීම් අධ්‍යයනය කොට මෙම ක්ෂේත්‍ර වෙන්කොට හඳුනාගත යුතුය.

### සොක්‍රටීස්

ග්‍රීසියේ බිහිවූ විශිෂ්ඨ ගණයේ දාර්ශනිකයෙකු වශයෙන් සොක්‍රටීස් හැඳින්විය හැකිය. එහෙත් ඔහු පිළිබඳව මෙන්ම ඔහුගේ දර්ශනය පිළිබඳව හැදෑරීමට පැහැදිලි මූලාශ්‍රය නොමැත්තේ ඔහු විසින් තමාගේ දර්ශනය ලේඛනගත නොකළ බැවිනි. ඔහු පිළිබඳව කරුණු අධ්‍යයනයේ දී මූලාශ්‍රය වශයෙන් යොදා ගත හැක්කේ ඔහුගේ ශිෂ්‍යයන් විසින් ඔහු පිළිබඳව තබා ඇති සටහන්ය. ප්ලේටෝගේ 'ඇපලෝජි' නැමති සංවාදයේ සඳහන් වන ආකාරයට සොක්‍රටීස්ගේ උපත සිදුව තිබෙන්නේ ක්‍රි. පූ. 470 දී පමණය. ඔහුගේ පියා සොප්‍රොනිස්කස් නමැති මූර්ති ශිල්පියෙක් වන අතර මව පිනරීට් නමැති වින්නඹු කාන්තාවකි. සොක්‍රටීස්ගේ චරිත කථාව ආරම්භයේ සිටම අපූරු ස්වභාවයකින් යුක්තය. හැඩිදැඩි සිරුරක් හෙබි හෙතෙම



ශක්තිමත් මිනිසෙකු වූ අතර ඇඳුම් ඇදීමේ දී ඍතු භේදයකින් තොරව එකම ඇඳුමක් භාවිත කොට ඇත. එසේම මොහු කිසිදිනක පාවහන් පළඳා නැත. මොහු තරුණ වයසට පත්වෙත්ම කිසියම් ගුප්ත වූ හඬක් ඇසෙන බව විශ්වාස කළේය. මොහු මෙම හඬට සවන්දීම ප්‍රිය කළ අතර සමහර අවස්ථාවල දී එක දිගටම පැය ගණනක් නිශ්චලව හිඳ මෙම හඬ ශ්‍රවණය කළ බව පැවසේ. දර්ශනය හැදෑරීම එකල බොහෝ ග්‍රීක වැසියන් අතර ජනප්‍රියව පැවති නිසා සාම්ප්‍රදායික දාර්ශනික මතවාදයන්ගෙන් වියුක්ත නව දර්ශනයක් ඉදිරිපත් කළ සොක්‍රටීස් වටා තරුණ පිරිස් එකතු වූ බව සඳහන් වේ. සොක්‍රටීස්ගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය වූයේ එවකට ඇතැන්ස් නුවර විසූ ඩෙල්ෆික් නම් අනාගත වක්තෘවරයා ග්‍රීසියේ සිටින ඥානවන්තම මිනිසා සොක්‍රටීස් බව පැවසීමෙන් පසුවය. එය ඉතාමත් නිහතමානීව පිළිගත් මොහු සමාජයට යමක් කළ යුතුය යන හැඟීමෙන් යුක්තව විතණ්ඩවාදීන්ට විරුද්ධව සදාචාරය අගය කරන දාර්ශනිකයෙකු බවට පත්විය. තමා ඥානවන්තයා ලෙස දෙවියන් වහන්සේ ප්‍රකාශ කරන ලද්දේ තමාගේ අඥානකම පිළිබඳව ඥානයෙන් සිටිය නිසා යැයි යන්න ඔහුගේ අදහස විය.

සොක්‍රටීස් සිය ජීවිත කාලය සියල්ල ගත කළේ සමාජ සේවය සඳහාය. පෙර සඳහන් කළ පරිදි සොක්‍රටීස් තමාගේ දාර්ශනික සංකල්ප ලේඛන ගත කොට නැතත් මොහු පිළිබඳව ඔහුගේ ගෝලයන් විසින් විවිධ සටහන් තබා ඇත. මේ අතර ප්ලේටෝගේ සංවාදයන් විශේෂයෙන් වැදගත් කමක් උසුලන්නේ ඔහු සොක්‍රටීස් ළඟින්ම ඇසුරු කළ බැවිනි. මීට අමතරව සිනෝපන් නමැති සොක්‍රටීස්ගේ ගෝලයෙකු රචනා කළ '**මෙමරබිලියා**', '**සිම්පෝසියම්**' වැනි කෘති තුළින් ද එසේම ඇරිස්ටෝල්ගේ '**මෙටපිසික්ස්**' සහ ඇරිස්ටොපානිස්ගේ '**ක්ලවුඩ්ස්**' වැනි කෘති තුළින් ද මොහු පිළිබඳව කරුණු හැදෑරිය හැකිය.

සොක්‍රටීස්ගේ කාලයේ පැවති සමාජ දේශපාලන වටපිටාව එතරම් සාමකාමී වූවක් නොවේ. දේශපාලඥයින්ගේ ඒකාධිපති ක්‍රියා කලාපය නිසා සමාජය සදාචාරාත්මක අගය පිරිහෙමින් පැවතියේය. විශේෂයෙන් මෙම යුගයේ පැවති විතණ්ඩවාදී දර්ශනය නිසා බොහෝ තරුණ පිරිස් සදාචාරය වැනි කරුණු සාපේක්ෂ වශයෙන් දුටුවේය. එබැවින් ස්වකීය අවශ්‍යතාවන් ඉටුකරගැනීම සඳහා තරුණ පිරිස් සදාචාර නොවන මාර්ගයන් අනුගමනය කළේය. කුමන හෝ ආකාරයෙන් දේශපාලන බලය ලබා ගැනීම මොවුන්ගේ අරමුණ විය.

එසේම විතණ්ඩවාදීන්ගේ සංශය වාදය හා නාස්තික වාදය සමාජයේ පැවති සදාචාරාත්මක පද්ධතීන් තවත් දුර්වල කළේය. සොක්‍රටීස්ගේ වෑයම වූයේ විතණ්ඩවාදීන්ගේ මෙම වැරදි සංකල්ප තුළින් තරුණ පරම්පරාව මුදවා ගැනීමයි. සොක්‍රටීස් සඳහන් කරන ආකාරයට දර්ශනයේ අරමුණ පරම ඥානය හා පරම සාධුත්වය ලබා ගැනීමය. එසේම ඒ සඳහා මාර්ගය පෙන්වා දීමය.

සොක්‍රටීස්ගේ ක්‍රමවේදය වූයේ මිනිසුන් ගැවසෙන ස්ථානවල විවිධ පුද්ගලයන් සමග දාර්ශනික හා සදාචාරත්මක කරුණු සම්බන්ධයෙන් වාද විවාද පැවැත්වීමයි. ඔහුගේ දාර්ශනික මාතෘකාව වූයේ ජීවිතය මරණය, පුනරුප්පත්තිය, ඥානය වැනි කරුණුය. එසේම මෙම වාද විවාදයන් සඳහා සමාජයේ ඕනෑම කෙනෙකුට සහභාගී විය හැකිය. ඔහුගේ සමස්ත ජීවිතයම කැප වූයේ විතණ්ඩවාදීන්ගේ මතයන් බැහැර කිරීම සඳහාය. පොදු සත්‍යක් නොමැත ඥානයක් නොමැත ආගමත්, සදාචාරයක් නොමැත වැනි ඉගැන්වීම් ග්‍රීක සමාජය පිරිහීමට පත්කරන බව ඔහු තෙරුම් ගත්තේය. ඔහුගේ ප්‍රධාන අපේක්ෂාව වූයේ ඥානය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමයි. **'ඥානය සත් ගුණය වේ සත්ගුණය ඥානය වේ'** යන්න සොක්‍රටීස්ගේ විශිෂ්ඨ කියමනකි. ඥානය සහ සදාචාරය අතර සම්බන්ධතාවක් බිහිකළ පළමු අපරදිග දාර්ශනිකයා මොහුය. සොක්‍රටීස් දක්වන ආකාරයට මරණයට පෙර අවිද්‍යාව නසා ඥානය සාක්ෂාත් කර ගෙන තිබුනේ නම් එවැන්නෙක් මරණයට බිය විය යුතු නැත. එවිට ඔහුගේ ආත්මය සදාකාලික දෙවියන් සමග සැරිසරනු ඇත. එසේ නොමැති වුවහොත් නැවත වෙනත් ලෝකයක උපදී. එබැවින් කිසිවෙකු මරණයට බිය විය යුතු නැති බවත් මරණය කිසිවෙකුට අයහපතක් සිදු නො කරන බවත් සොක්‍රටීස් සඳහන් කළේය.

සොක්‍රටීස්ගේ යුගයේ ග්‍රීසියේ ජනප්‍රියව පැවතියේ විතණ්ඩවාදීන්ගේ දර්ශනයයි. ඔවුන්ගේ ප්‍රධාන ඉගැන්වීම් වූයේ සියලු ප්‍රපඤ්චයන් සාපේක්ෂ බවය. ඒ අනුව සදාචාරය, සත්‍ය, ඥානය වැනි ඉගැන්වීම් පුද්ගලානුබද්ධ බව ඔවුන්ගේ මතයයි. එහෙත් මෙම විතණ්ඩවාදීන්ගේ ඉගැන්වීම් දැඩිව විවේචනය කළ සොක්‍රටීස් සත්‍ය, ඥානය, සදාචාර වැනි ප්‍රපංච සාපේක්ෂ නොවන ප්‍රපංච බව පෙන්වා දුන්නේය. මේවා සහජ සංකල්ප වශයෙන් සොක්‍රටීස් හඳුන්වා දී තිබේ. පුද්ගලයා සතුව ස්වභාවයෙන්ම චිත්ත වේග, සහජාස තිබෙන්නා සේම



සදාචාරය ද (සත්ගුණය) සහජයෙන්ම පුද්ගලයා තුළ පවතින බව සොක්‍රටීස් මතයයි.

ඔහුට අනුව දාර්ශනිකයාගේ කාර්ය වනුයේ පුද්ගලයා තුළ බවතින සහජ සංකල්ප අර්ථවත් කොට යොදා ගැනීමට මගපෙන්වාදීමයි. ඉන්ද්‍රියානුසාරීව ගොඩනැගෙන ඥානය සාපේක්ෂ බව සොක්‍රටීස් පවා පිළිගන්නා අතර සැබෑ 'ඥානය' යන්න ගොඩ නැගෙන්නේ ඉන්ද්‍රියානුසාරීව නොවන බව සොක්‍රටීස්ගේ මතයයි. ඉන්ද්‍රියානුසාරීව ගොඩනගා ගන්නා වූ ඥානය ප්‍රවාහීභාවයකින් යුක්ත වන අතර සොක්‍රටීස් අදහස් කළ ඥානය එසේ වහා වෙනස් වන්නක් නොව ස්ථිර භාවයකින් යුක්තය. ඉන්ද්‍රියගෝචර හා බුද්ධිගෝචර යනුවෙන් ඥානයේ ප්‍රභේද දෙකක් ඇති බව දක්වන සොක්‍රටීස් වඩා වැදගත්කොට සලකන්නේ බුද්ධිගෝචර ඥානයයි. සොක්‍රටීස් දක්වන ආකාරයට මිනිසා යනු හුදු සංවේදනයන්ට හා අනුභූතීන්ට සීමා වූ සත්වයෙක් නොවේ. ඉන් එහා ගිය බුද්ධිය කියා දෙයක් ද පුද්ගලයා සතුව පවතින අතර එය ආත්මය සමග සම්බන්ධව පවතින්නකි. එබැවින් මිනිසා යනු බුද්ධිය සහ සංවේදනයන් යන මෙම සියල්ලේම එකතුවකි. එබැවින් විතණ්ඩවාදීන් මිනිසා පිළිබඳව දක්වා ඇති නිර්වචන තුළින් ඔහුගේ හැකියාවන් සීමා වන බව සොක්‍රටීස් ප්‍රකාශ කරයි.

සොක්‍රටීස් ඥානය වශයෙන් හඳුන්වා දෙන්නේ සංකල්ප තුළින් ලැබෙන දැනුමකටය. උදාහරණ වශයෙන් පුද්ගලයා විසින් බාහිර ලෝකයේ විවිධ සුන්දර වස්තූන් අත්විඳුනු ලබන නමුත් එම වස්තූන් වලට සුන්දර භාවය ලැබෙන්නේ සුන්දරත්වය නැමති සංකල්පය තුළිනි. කිසියම් වස්තුවක් පළමුව දැක නැවතත් එම වස්තුව සිහිපත් වන විට ඒ පිළිබඳ සංකල්ප අපගේ මනසේ ඇතිවේ. සොක්‍රටීස්ට අනුව මෙම සංකල්ප ඇතිවන්නේ අපගේ බුද්ධිය ආශ්‍රය කරගෙනය. ඒ අනුව සොක්‍රටීස් ඥානය යනුවෙන් පවසන්නේ ඉන්ද්‍රිය සංවේදනයන්ට අනුව මනසේ ගොඩ නැගෙන සංල්පයන්ටය. නොඑසේ නම් විතණ්ඩවාදීන් ඉදිරිපත් කරන පෞද්ගලික අනුභූතීන්ට හෝ සංවේදනයන්ට නොවේ. සොක්‍රටීස්ට අනුව සංකල්ප පවතින්නේ බුද්ධිය නිසාවෙනි. තර්කයන් ගොඩ නැගීමට හේතුවන්නේ බුද්ධියයි. තර්ක කිරීමට අවශ්‍ය වන ප්‍රස්තුතයන් ගොඩ නගන්නේ සංල්ප මාර්ගයෙනි. පොදුවේ තර්කයන් තුළ උද්ගාමී හා නිගාමී ක්‍රම දෙකක් පවතී. උද්ගාමී ක්‍රමය තර්ක ශාස්ත්‍රයට හඳුන්වා දුන්නේ සොක්‍රටීස් බව ඇරිස්ටෝටල් දක්වා ඇත.

සොක්‍රටීස් විසින් ලෝකයට හඳුන්වා දුන් තවත් වැදගත් ඉගැන්වීමක් නම් නිර්වචනයයි. පුද්ගලයා ඥානය ගොඩනගා ගන්නේ මෙම නිර්වචන මාර්ගයෙන් බව සොක්‍රටීස් සඳහන් කරයි. කිසියම් වස්තුවක් තුළ වූ පොදු ලක්‍ෂණ නිර්වචනයන් තුළින් හඳුනාගැනේ. එසේම නිර්වචනයන් තුළින් භාෂාව උපයෝගී කරගෙන සත්‍ය පිළිබඳ පොදු මිණුම් දඬු සකසා ගත හැක. ගණිතයේදී ත්‍රිකෝණ සමචතුරස්‍ර, පංචාස්‍ර ආදිය පහසුවෙන් හඳුනාගැනීම සඳහා නිර්වචනය කර තිබෙන්නාසේ සත්‍ය, ඥානය, සුන්දරභාවය, සත්ගුණ වැනි සංල්පයන් ද නිර්වචනය කළ හැකිය. කිසියම් වූ ක්‍රියාවක යහපත අයහපත තීරණය කිරීමට නම් සදාචාරය යන්න නිර්වචනය කර තිබිය යුතුය. මෙම නිර්වචනය තුළ පෞද්ගලික වූවක් නොව පොදු වූ වාස්තවික හැඩයක් ප්‍රකට කෙරේ. එබැවින් විතණ්ඩවාදීන් පවසන සදාචාරය පෞද්ගලිකය යන මතය ප්‍රතික්ෂේප වේ. සොක්‍රටීස් සඳහන් කරන ආකාරයට සදාචාරය නිර්වචනය කළ යුත්තේ සමාජයේ සෑම පුද්ගලයෙකුමගේම අයිතිවාසිකම් රැකෙන අයුරෙණි.

ඥානය පිළිබඳව සොක්‍රටීස් සඳහන් කළ ඉගැන්වීම් ද මෙම න්‍යාය ඔස්සේ තෙරුම් ගත යුතුය. ඔහු සඳහන් කළේ ඥානය සාධුත්වය වේ. එහෙත් ඔහු දක්වන ඥානය හෝ සාධුත්වය පුද්ගල බද්ධ වූවක් නොවේ. එය පුද්ගල වසඟයේ පවතින දෙයක් නම් අනෙකුත් වස්තූන් මෙන් අස්තිර භාවයට පත් වේ. එබැවින් සොක්‍රටීස් සඳහන් කරන ඥානය, සාධුත්වය මිනිස් හැඟීම් ඉක්මවා පවතින උත්කෘෂ්ට දෙයකි. එබැවින් එය දාර්ශනිකව අර්ථකථනය කළ හැකිය. එබැවින් සොක්‍රටීස් සඳහන් කරන සාධුත්වය තවෙකෙකුට ඉගැන්වීමට හැකිය. සොක්‍රටීස් සඳහන් කරන ආකාරයට ඥානය, සාධුත්වය අන්‍යෝන්‍යව බැඳී පවතී. ඥානය ලබා ගැනීම යනු සාධුත්වය සාක්ෂාත් කිරීමයි. ඥානය ලබා ගත් පුද්ගලයා කිසිදු අයහපතක් සිදු නොකරයි. එයට හේතුව වශයෙන් දක්වා ඇත්තේ එම පුද්ගලයා අවිද්‍යාව නැති කළ තැනැත්තෙක් වීමයි. මෙහි දී අවිද්‍යාව ලෙස සොක්‍රටීස් දක්වා තිබෙන්නේ යහපත හා අයහපත පිළිබඳ පවත්නා අනවබෝධයයි. එම අනවබෝධය නැති කළ විට එම පුද්ගලයාට සත්ගුණය පිළිබඳ ඥානය ඇති වේ. එනම් යහපත අයහපත පිළිබඳව ඥානයයි. එවැනි පුද්ගලයන් යුක්තිය ඉටුකිරිමට සැදී පැහැදී සිටී. සොක්‍රටීස්ට අනුව සදාචාරයේ උල්පත වන්නේ ඥානයයි. එසේම එය සාක්‍ෂාත් කරගත



යුත්තක් වශයෙන් දක්වා තිබේ. ඥානය නමැති සූර්යා විකසිත වීමත් සමග අවිද්‍යා නමැති අන්ධකාරය පහව යන බව දක්වා ඇත.

එහෙත් මිනිස් මනසේ සංවේදන අංශ පිළිබඳ සොක්‍රටීස් සැලකිල්ලක් දක්වා නොමැති බැවින් එය ඔහුගේ දර්ශනයේ කිසියම් ඌනතාවක් බව ඇරිස්ටෝටල් සඳහන් කර ඇත. මිනිසුන් විවිධ අපරාධ, කුමන්ත්‍රණ සිදුකරන්නේ ඒවා අයහපත් ක්‍රියාවන් යැයි නොදැන නොවේ. ඒවාගේ ආදීනව දැන දැනත් එවැනි ක්‍රියාවල නිරත වන්නේ චිත්තවේගවල බලපෑමෙනි. සදාචාරය ඉගැන් වූ පමණින් සියලු පුද්ගලයන් යහපත් පුද්ගලයින් වේයැයි කිව නොහැකි වන්නේ එබැවිනි. කෙසේ වුවද 'ඥානය සාධුත්වය වේ' යන සොක්‍රටීස්ගේ ඉගැන්වීම දාර්ශනික ඉතිහාසයට විශාල බලපෑමක් ඇති කළේය. මෙහි දී සොක්‍රටීස් දක්වන සාධුත්වය අමරණීය වෙනස් නොවන සුළු සාධුත්වයකි. එම සාධුත්වය ලබා ගැනීම යනු ආත්ම සාක්‍ෂාත් කරණයට සමාන වූවකි. එවැනි පුද්ගලයෙකුට සමාජයේ අන්‍යන්ට ද සාධුත්වය ඉගැන්විය හැකිය. එහෙත් මෙවැනි තත්වයට පත් වූ පුද්ගලයෙක් සිටී ද යන පැනයට පිළිතුරු සොක්‍රටීස් විසින් සපයා නැත. එහෙත් ඔහුගේ ඉැන්වීම් දෙස බලන විට සොක්‍රටීස් එම තත්වයට පත්වූ පුද්ගලයෙක් වශයෙන් අනුමාන කළ හැකි බව ඇතැමෙක් පවසති.

**ප්ලේටෝ**

ක්‍රි. පූ. 428-328 අතර කාලය තුළ ජීවත් වූ ප්ලේටෝ අපරදිග දර්ශනය කෙරෙහි දැඩි බලපෑමක් කළ දාර්ශනිකයෙකු වශයෙන් සැලකේ. 'The Republic' නමැති කෘතියේ සඳහන් වන ආකාරයට ඔහුගේ පියා ඇරිස්ටන් නමැති වංශවතෙකි. මව පෙරෙක්ටියන් නමැති වංශවත් කාන්තාවකි. ස්වකීය වංශය පිළිබඳ ප්ලේටෝ ආඩම්බරයෙන් සිට ඇත. ප්ලේටෝගේ දර්ශනය සැලකෙනුයේ මෙතෙක් ග්‍රීසියේ පැවති දාර්ශනිකයන්ගේ ඉගැන්වීම් අධ්‍යයනය කොට ඒවායෙහි පැවති අඩු ලුහුඬු තැන් සකස් කොට ඉදිරිපත් කළ නව දර්ශනයක් ලෙසය. එහෙත් මේ තුළින් පැරණි දර්ශනයන් අනුකරණයෙන් ප්ලේටෝගේ දර්ශනය ගොඩ නැගුණු බව අදහස් නොවන අතර පැරණි දර්ශනයන් හි පැවති දාර්ශනික බීජයන් වඩාත් ඵලදායි ලෙස සංවර්ධනය කිරීමට ප්ලේටෝ ක්‍රියාකර ඇත. ඔහුගේ දර්ශනය බොහෝ ලෙස ගොඩනැගුනේ දේශපාලන දර්ශනයක් ලෙසිනි. එහෙත් ඔහුගේ

දේශපාලන දර්ශනය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීමට ඉඩ නොලැබූ බව පෙනී යයි. එයට හේතුව ඔහුගේ කාලයේ ඇතැන්ස් නුවර දේශපාලන වශයෙන් ව්‍යාකූලව පැවතීමයි. මෙම නොසන්සුන් දේශපාලන රටාව තුළ ප්‍රජාතන්ත්‍රවාදය පිරිහී ගියේය. කෙසේ වුව ද ප්ලේටෝ දැඩිව විශ්වාස කළේ ප්‍රජාන්ත්‍රවාදය ස්ථාපිත කිරීමට නම් රදළවරුන්ට දේශපාලන බලය ලැබිය යුතු බවයි. එයට හේතුව වශයෙන් ඔහු දැක්වූයේ වංශක්කාරයින් ළඟ සහජයෙන්ම දුරදිග බැලීමේ නුවණ ද ශික්ෂණයද පිහිටා ඇති බැවිනි. තව ද ප්ලේටෝ වංශවතුන් පිළිබඳ ඇල්මක් දැක්වූයේ ඔහු ද වංශවතෙක් බැවිනි.

කෙසේ වුවද ප්ලේටෝගේ පරිකල්පනය වැරදි වූයේ මොහු ජීවමාන කාලයේම ඇතැන්ස් නුවර පාලනය වංශවතුන් අතට පත් වූ අතර ඔවුන් ද දේශපාලන බලය ලබා ගත් සෙසු පුද්ගලයින් මෙන් වෛරය පළිගැනීම මෙන්ම කෝපය පැතිර වූ නිසාය. මෙයින් ප්ලේටෝ කලකිරීමට පත් වූ අතර ඉන්පසු සමස්ත ජීවිතයම දර්ශනයේ දියුණුව සඳහා කැප කළේය. ග්‍රීක දාර්ශනිකයන් අතර බොහෝ කෘති ප්‍රමාණයක් ආරක්ෂා වී ඇත්තේ ප්ලේටෝගේය. එහෙත් ප්ලේටෝ තම දර්ශනය කිසිවිටත් ග්‍රන්ථාරූඪ නොකළ බව සඳහන් වේ. එයට හේතුව ලෙස ඔහු දක්වන්නේ ස්වකීය දාර්ශනික අදහස් ලේඛනගත කිරීමේදී ඒ අයුරින්ම ප්‍රකාශයට පත් නොවන බවයි. එබැවින් ඔහුගේ කෘති බොහොමයක් ඔහුගේ ශිෂ්‍යයින් විසින් ඔහුගේ දේශනා ආශ්‍රයෙන් රචනා කළ බව විශ්වාස කෙරේ. ඇතැන්ස් නුවර 'ඇකඩමි' නම් ආයතනයක් පිහිටුවාගත් හෙතෙම වසර 40 නොමිළේ දර්ශනය ඉගැන්වීය. සමස්තයක් වශයෙන් බලන විට සොක්‍රටීස් මෙන්ම ප්ලේටෝ ද විතණ්ඩවාදීන්ගේ සංශය වාදය හා නාස්තික වාදය ප්‍රතික්ෂේප කළේය. ප්ලේටෝ සොක්‍රටීස් පිළිබඳ ඉතා ගෞරවයෙන් සඳහන් කර තිබේ. එහිදී සොක්‍රටීස්ගේ සාධුත්වයට ඉතා උසස් තැනක් ලබා දී තිබේ. එහෙත් සොක්‍රටීස්ගේ සාධුත්වයට වඩා ආධ්‍යාත්මික බවින් හා තාර්කික බවින් ඉතා ගැඹුරට ගිය දර්ශනයක් ප්ලේටෝ ඉදිරිපත් කළ බව පෙනේ.

ප්ලේටෝගේ දර්ශනය අන්තර්ගත සංවාද විසිපහක් පමණ දැනට සොයාගෙන ඇත. ඉයන්, ගොර්ගියාස්, ප්‍රොතගෝරස්, ඇපලෝජී, ක්‍රිටෝ, රිපබ්ලික්, තියටේටස් වැනි සංවාද ඒ අතර කිහිපයකි. ප්ලේටෝ දක්වන ආකාරයට සාමාන්‍ය ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය ඉතා දුර්වල මට්ටම පවතී. සොක්‍රටීස් මෙන් ප්ලේටෝ



කිසිම අවස්ථාවක සාමාන්‍ය ජනයා ගැවසෙන ස්ථාන දේශන සඳහා යොදා නොගත්තේය. ඒ වෙනුවට ඔහු ඇකඩමි ආයතනයේ දර්ශනය හැදෑරීමට කැමති පිරිසට නිශ්ශබ්දතාවෙන් ඉගෙනීමට අවස්ථාව ලබා දුන්නේය. ඒ තුළින් ඔහු බලාපොරොත්තු වූයේ යහපත් පාලකයින් බිහි කිරීමය. ඒ තුළින් ග්‍රීසිය දිව්‍යමය යථාර්ථයේ සමීපතම පිටපතක් බවට පත් කිරීමට ඔහු අපේක්ෂා කළේය. පාලකයා සම්බන්ධයෙන් ඔහුගේ අදහස නම් 'පාලකයා දාර්ශනිකයෙක් විය යුතුය. නොඑසේනම් දාර්ශනියෙකු පාලකයා විය යුතුයි.' මිනිසා අපේක්ෂා කරන ප්‍රජාතන්ත්‍රවාදය ලැබිය හැක්කේ එවැනි පාලකයෙකු තුළින් පමණි. ඥාන විභාගය හා දේශපාලන දර්ශනය වශයෙන් ප්ලේටෝගේ දර්ශනය ප්‍රධාන කොටස් දෙකක් යටතේ විග්‍රහ කළ හැකිය. මෙහි දී අප උත්සාහ කරන්නේ ඥාන විභාගය සම්බන්ධයෙන් ප්ලේටෝ දැරූ අදහස් කුමක්දැයි අධ්‍යයනය කිරීමය.

ප්ලේටෝගේ ඥාන විභාගය ආරම්භ වන්නේ ද සමකාලීන යුගයේ පැවති විතණ්ඩවාදීන්ගේ අදහස් ප්‍රතික්ෂේප කරමිනි. විතණ්ඩවාදී දාර්ශනිකයන් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළින් ලැබෙන නිගමනවලට අනුව සත්‍ය, ඥානය වැනි සංකල්ප සාපේක්ෂ වශයෙන් ගෙන හැර දැක්වීය. මෙහි දී සාපේක්ෂ වශයෙන් අදහස් කර තිබෙන්නේ ඥානය, සත්‍ය වැනි සංකල්ප පෞද්ගලිත්වයක් උසුලන බවයි. එනම් පුද්ගලයාගෙන් පුද්ගලයාට මේවාගේ ස්වරූපය වෙනස් වේ. ඒ අනුව ප්‍රත්‍යක්ෂය තුළින් පමණක් ගොඩනැගෙන සත්‍ය සෑම විටම විශ්වාස කළ නොහැකිය.

මේ පිළිබඳ ප්ලේටෝ දක්වන ආකාරයට සැබෑ ඥානය ඉන්දියානුසාරී ස්වභාවයෙන් පිටත පවත්නා දෙයකි. ඔහු සඳහන් කරන ආකාරයට ඉන්ද්‍රිය ඥානයන් තුළින් දැනුමක් ලබාදීම සත්‍යයකි. එසේ ලබා දෙන දැනුම සීමා සහිත වූවක් බව ප්ලේටෝගේ අදහසයි. එයට හේතුව අප විසින් අත්දකින ලෝකය ලෝකයේ යතා ස්වභාවය නොවීමයි. ඥානය යනුවෙන් ඔහු අදහස් කරන්නේ පරිපූර්ණ ඥානයයි. ඉන්ද්‍රීය ප්‍රත්‍යක්ෂය තුළින් පරිපූර්ණ ඥානයක් ලැබිය නොහැක. සත්‍යක් නම්, ඥානයක් නම් කිසිවිටකත් වෙනස් විය නොහැක. ඒවා සදාකාලික වූවක් ලෙස ප්ලේටෝ දක්වයි. ඔහුට අනුව මෙවැනි පරිපූර්ණ ඥානයක් ලබාගත හැක්කේ දාර්ශනිකයාට පමණි. දාර්ශනිකයා යන්නෙන් ඔහු අදහස් කරන්නේ ප්‍රඥාවට කැමති උත්තමයාය. මෙය උදාහරණ සහිතව පැහැදිලි කරන්නේ සාමාන්‍ය

පුද්ගලයෙකුගේ හා දාර්ශනිකයෙකු තුළ පවත්නා රසඥතාවය තුළිනි. සාමාන්‍ය පුද්ගලයා කිසියම් සුන්දර වස්තුවකට හෝ මිහිරි සංගීතයකට කැමතිවිය හැකිය. එහෙත් දාර්ශනිකයා කැමති වන්නේ සුන්දර වස්තුවකට නොව සුන්දරභාවයටය. සුන්දර වස්තුවට කැමති වන පුද්ගලයාගේ රුචිකත්වය එකී වස්තුන්ගේ ස්වරූපය මත වෙනස් වී යන්නේය. එහෙත් සුන්දරත්වයට කැමති දාර්ශනිකයාගේ රුචිය කිසිදා වෙනස් නොවේ. එයට හේතුව සුන්දරත්වය කිසිදා වෙනස් නොවන බැවිනි. ඒ අනුව සාමාන්‍ය පුද්ගලයාගේ මනස වෙනස් වන අතර දර්ශනවාදියාගේ ඥානය ස්ථිර ස්වභාවයකින් යුක්ත වේ. එබැවින් ප්ලේටෝ අදහස් කරන ඥානය වහා ඇති වී නැති වී යන්නක් නොවේ.

මේ අනුව ප්ලේටෝ අදහස් කරන ඥානය මෙම භෞතික ලෝකය තුළ පවත්නා දෙයක් නොවේ. ප්‍රපංච ලෝකයේ පවත්නා ඥානය වෙනස් වන ස්වභාවයෙන් යුක්තය. සැබෑ ඥානය ස්පර්ශ කළ නොහැක. ඒ සඳහා ඉන්ද්‍රය අත්දැකීමෙන් මිදිය යුතු බව ඔහු සඳහන් කරයි. මේ ඥානය ඔහු පැහැදිලි කරන්නේ ගුප්ත ප්‍රතිභානයක් වශයෙනි. එය පවතින්නේ මේ ලෝකයේ නොව ආකෘතික ලෝකයේය. ප්ලේටෝට අනුව ඥනය යනු ආකෘතික ලෝකයයි.

සොක්‍රටීස් ඥානය වශයෙන් හැඳින්වූයේ විල්පයන් හෙවත් නිර්වචනය තුළින් ඇති කරගත් ඥානයයි. සොක්‍රටීස් විසින් ඉදිරිපත් කර මෙම ඥානය පිළිබඳ  සංල්පය තවදුරටත් ඉදිරියට රැගෙන යන ප්ලේටෝ ඒ තුළින් අධිභෞතික වාදයක් ගොඩ නැගීමට උත්සහ කර තිබේ. ප්ලේටෝ දක්වන ආකාරයට නිර්වචනය යන්න නිදහස් වූ ලෝකෝත්තර ලෝකයක පවතින්නා වූ වස්තුන් කොට්ඨාශයකි. ඔහු මෙම ආකෘති ලෝකය පිළිබඳ තියේටස් නමැති කෘතියේ සඳහන් කරයි. ඔහු දක්වන මෙම ආකෘතික ලෝකය යථාභූත ලෝකයයි. ඔහු ඥානය වශයෙන් හඳුන්වන්නේ සොක්‍රටීස් දක්වන ආකාරයටම විකල්ප තුළින් ගොඩනගා ගන්නා දෙයයි. එහෙත් ප්ලේටෝ මෙය තව දුරටත් සියුම් ලෙස විග්‍රහ කර ඇත.

ප්ලේටෝට අනුව යහපත, සුන්දරභාවය, සත්‍ය ආදි වශයෙන් දක්වන විකල්පයන්හි මූලික ආකෘතිය පවත්නේ පුද්ගල ඥානයෙන් පරිබාහිරවය. පුද්ගලයාගේ ඥානයේ පවත්නේ ඒවායේ පිටපත් ස්වරූපයන් පමණි. ඔහු දක්වන ආකාරයට ප්‍රපංච ලෝකයේ පවත්නා ද්‍රව්‍යාත්මක දේ විනාශයට පත් වේ. එහෙත් මෙම ආකෘතීන් එසේ



විනාශට පත්වන වස්තු කොට්ඨාශයක් නොවේ. තවද මෙම විකල්පයන්ගෙන් අපට ලබා දෙන්නේ සීමිත වූ ඥානයයි. එයට හේතුව ඒවා ආකෘතීන්හි පිටපත් වන බැවිනි. නියම ආකෘතිය පවතින්නේ උත්තර සංවේදනීය ආකෘතික ලෝකයෙහිය. එම ලෝකය අපගේ ලෝකයෙන් වෙනස් වූවකි. ඥානය යැයි කිව හැක්කේ එකී ආකෘතික ලෝකය හා සම්බන්ධ ඥානයට පමණි. ආකෘති ලෝකය පිළිබඳ අවබෝධය ලැබීම නියම ඥානය වශයෙන් දක්වා ඇත. එය කිසියම් ස්වරූපයක ආත්ම සාක්ෂාත් කරණයක් වශයෙන් ප්ලේටෝ සඳහන් කරයි. මේ අනුව සොක්‍රටීස් සහ ප්ලේටෝගේ ඥානය පිළිබඳ අදහස මාර්ග දෙකක ගමන් කරන බව පෙනේ. ප්ලේටෝ දක්වන ආකාරයට සොක්‍රටීස් දැක්වූ ඥානය ප්‍රපංච ලෝකය හා සම්බන්ධ බැවින් සීමා සහිත වූවකි. සැබෑ ඥානය යනු යථානුභූතය සාක්ෂාත් කර ගැනීමයි. ඉන් අනතුරුව ප්ලේටෝ ආකෘතීන්ගේ ස්වරූපය පිළිබඳව දක්වා තිබේ. ඔහු දක්වන ආකාරයට ආකෘතීන් තුළ බාහිර ලෝකයේ පවත්නා වස්තුන් මෙන් ඇති වී නැති වි යන ස්වභාවයක් නොමැත. එබැවින් ආකෘතියක පිටපත සහ මූලික ආකෘතියේ ස්වභාවය අහසට පොළව මෙන් දුරස්ය. උදාහරණයක් වශයෙන් මිනිසා නමැති ආකෘතිය ගත් විට පුද්ගලික වශයෙන් මිනිසුන් ඕනෑ තරම් ලෝකයේ සිටියත් සමස්ත මනුෂ්‍ය වර්ගයාටම ඇත්තේ එකම ආකෘතියක් පමණි. එසේම සියලු මිනිසුන් මිය ගියද මිනිසා නමැති ආකෘතිය මිය යන්නේ නැත. එබැවින් එය නිත්‍ය සදාකාලික වූවකි. පෞද්ගලික වශයෙන් මිනිසුන් ජරා, ව්‍යාදියට පත් වූවද ආකෘතිය විනාශ වන්නේ නැත. එයට හේතුව මෙය හා කාලය හා අවකාශය සම්බන්ධ නොවීමයි.

මේ ආකාරයට ප්ලේටෝ විසින් යථාභූත ඥානයක් පිළිබඳ අදහස් ඉදිරිපත් කර තිබූව ද එය සාක්ෂාත් කළ හැකි මාර්ගයක් පිළිබඳ අදහසක් ඉදිරිපත් නොකිරීම නිසා ඔහුගේ දර්ශනයේ කිසියම් ඌනතාවක් පවතින බව බොහෝ විචාරකයින්ගේ අදහසයි. කෙසේ වුව ද දාර්ශනික ක්ෂේත්‍රය තුළ විධිමත් දාර්ශනික පද්ධතියක් ගොඩ නැගීම සඳහා ප්ලේටෝ සුවිශාල දායකත්වයක් දක්වා ඇත. ඔහු විසින් දේශපාලන කරුණු අරබයා ඉදිරිපත් කර තිබෙන ඉගැන්වීම් තුළින් එම ක්ෂේත්‍රය පිළිබඳ ඔහු තුළ පැවති දැනුම් සම්භාරය කෙබඳු ද යන්න මනාව වැටහේ.

## ඇරිස්ටෝටල්

ඇරිස්ටෝටල් ක්‍රි. පූ. 383 දී පමණ උතුරු ග්‍රීසියේ දී උපත ලබයි. ඔහුගේ පියා නිකොමාකස් නමැති වෛද්‍යවරයෙකි. ඔහු රාජකීය වෛද්‍යවරයෙක් වශයෙන් මැසිඩෝනියානු රාජ සභාවට සේවය කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් රාජකීය පවුල සමග සමීප සබඳතා පැවැත්වීමට අරිස්ටෝටල්ට හැකි විය. මේ යුගය වන විට ඇතැන්ස් නුවර ප්ලේටෝ විසින් ආරම්භ කර තිබූ ඇකඩමිය පිළිබඳ කීර්තිය ග්‍රීසිය පුරාම ව්‍යාප්තව පැවතුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වයස අවුරුදු 14 දී ශිෂ්‍යයෙකු වශයෙන් ඇරිස්ටෝටල් මෙම ඇකඩමියට බැඳුනේය. එතැන් සිට වයස අවුරුදු 37 දක්වා එහි අධ්‍යාපන කටයුතු කරගෙන ගිය අතර ඇරිස්ටෝටල්ගේ අභාවයෙන් පසු ප්ලේටෝ ඇකඩමිය අතහැර ගිය බව සඳහන් වේ.

ඇරිස්ටෝටල් පෞද්ගලික වශයෙන් ස්වකීය ගුරුවරයා විවේචනය කිරීමක් ඔහුගේ කෘති තුළින් දැකගත නොහැකිය. තමන්ගේ ඥානය සම්බන්ධයෙන් ප්ලේටෝට ණය ගැති බව සඳහන් කර ඇත. එහෙත් ප්ලේටෝගේ මරණින් පසු ඔහුගේ දර්ශනයේ පැවති දුර්වලතා දැඩි ලෙස විචාරයට ලක් කිරීමට ඇරිස්ටෝටල් උත්සාහ ගෙන ඇති අයුරු ඔහුගේ දර්ශනය තුළින් පැහැදිලි වේ. කෙසේ වුවද ක්‍රි. පූ. 343 දී මැසිඩෝනියාවේ රජු වූ පිලිප්ගේ පුත්‍රයා වන ඇලෙක්සැන්ඩර්ට අධ්‍යාපනය ලබා දීම සඳහා ඇරිස්ටෝටල්ට ආරාධනා කර තිබේ. මැසිඩෝනියානු රාජ සභාවේ ඉතා කීර්තිමත් පුද්ගලයෙකු වශයෙන් ඇරිස්ටෝටල් කටයුතු කර තිබේ. ඔහුගේ ශාස්ත්‍රීය කටයුතු සඳහා විශාල දායකත්වයක්ද රජය මගින් දක්වා ඇත. පිලිප් රජුගේ මරණින් පසු ඔහු පුත් ඇලෙක්සැන්ඩර් මැසිඩෝනියාවේ රජ විය. එහෙත් ඇරිස්ටෝටල් නැවත වරක් ඇතැන්ස් නුවරට යන අතර එහි දී සිනෝක්‍රාස්ට් යටතේ ඇකඩමිය දීප්තිමත්ව තිබෙනු දැක ඔහු විසින්ද **ලිසිම්** නමින් තවත් විද්‍යස්ථානයක් එහි ආරම්භ කර ඇත. ඉන් අනතුරුව මෙම විද්‍යස්ථාන දෙක අතර විශාල තරඟකාරිත්වයක් පැවතියේය. ඇරිස්ටෝටල්ගේ ආයතනය ඒ අතරින් වඩා ජනප්‍රිය වූ බව සඳහන් වේ.

ඇරිස්ටෝටල් දාර්ශනික අංශය පිළිබඳ පමණක් නොව විවිධ ක්ෂේත්‍ර පිළිබඳ පැතිරුණු බුද්ධියක් තිබූ පුද්ගලයෙකි. දර්ශනයට අමතරව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, තාරකා විද්‍යාව, මනෝවිද්‍යාව



වැනි විෂයයන්ට අදාළ කෘති මොහු විසින් රචනා කර තිබේ. මොහුගේ මෙම හැකියාවන් අන්‍යයන් මවිත කරවන තරම්ය. මධ්‍යකාලීන යුගයේ ව්‍යාප්ත වූ විද්‍යාත්මක දියුණුවට මොහුගේ මෙම අදහස් දැඩිව බල පෑ බව සඳහන් වේ. ඔහු විසින් හඳුන්වාදෙන ලද තාර්කික අදහස් අඩංගු ක්ෂේත්‍රය ඕගැනැන් නමින් හඳුන්වා ඇත. මෙහි දී ද්‍රව්‍ය වස්තු සහ පදාර්ථ පිළිබඳ විස්තර කොට ඇත. තවද බහුවිධ ප්‍රස්තුත පිළිබඳ ඔන් ඉන්ටර්ප්‍රිටේෂන් (On interpretation) වශයෙන් ද සංවාක්‍ය පිළිබඳව ඇනලිටික් (analytic) නමැති කොටස් මෙන්ම උද්ගාමී හා නිගාමී ක්‍රම අඩංගු කොටස් ද මෙහි ඇතුළත්ය.

මොහු ප්ලේටෝ ඉදිරිපත් කළ අවිනශ්වර ආකෘති ලෝකය තුළින් නිරන්තරයෙන් පරිණාමයට පත් වන අනිත්‍ය ස්වභාවය දරන්නා වූ ප්‍රපංච ලෝකයේ වස්තූන් විස්තර කරන්නේ කෙසේදැයි ප්‍රශ්න කළේය. එය දැක්වූයේ අහසේ පියාසර කරන පක්ෂීන් ගණන් කිරීම හා සමාන අඥාන ක්‍රියාවක් ලෙසය. ලෝක ක්‍රියාකාරිත්වය අසංඛ්‍ය සංඛ්‍යාත වූ ප්‍රපංචයන්ගෙන් සැදුනකි. දර්ශනයෙහි කාර්යභාරය විය යුත්තේ එම විශ්ව නියාම ක්‍රියාකාරිත්වය පිළිබඳ වටහා දීමයි. එහෙත් ප්ලේටෝගේ ආකෘති වාදය තුළින් එවැන්නක් දැක ගත නොහැකි බව පෙන්වා දුන්නේය. එය ඔහුගේ දර්ශනයේ පවත්නා පැහැදිලි දුර්වල කමක් බව ඇරිස්ටෝටල් පවසයි. ආකෘති ඉන්ද්‍රිය ගෝචර නොවන බව ප්ලේටෝ සඳහන් කළ ද එම ආකෘති සංකල්පය ගොඩනඟාගෙන තිබෙන්නේ ඉන්ද්‍රය ගෝචර ප්‍රපංච වස්තූන්ගේ මාර්ගයෙනි. ඇරිස්ටෝටල්ගේ දර්ශනය ආරම්භ වන්නේ ප්ලේටෝගේ මෙම ආකෘති ලෝකය විවේචනය කිරීමෙනි. ඇරිස්ටෝටල්ට අනුව මනුෂ්‍යත්වය පැවතිය යුත්තේ මිනිසා නමැති ප්‍රපංච ලෝකයේ සිටිනා සත්වයා තුළය. එසේ නොමැති නම් එයින් ප්‍රයෝජනයක් නොමැත. එසේ මනුෂ්‍යත්වයට මනුෂ්‍යත්වය නොමැතිව පැවැත්මක් ද නොමැත.

මීට අමතරව ඇරිස්ටෝටල්ගේ දර්ශනයේ වැදගත් අංගයක් වශයෙන් හේතුඵල වාදය පිළිබඳ ඔහු විසින් ඉදිරිපත් කරන සංකල්ප දැක්විය හැකිය. ඔහු දක්වන ආකාරයට හේතුඵලවාදය වර්තමානයේ පිළිගන්නා සරල අදහසක් නොව ඉතා ගැඹුරු පැතිරුණු සංල්පයකි. ඔහුට අනුව ද්‍රව්‍ය, කාරක, රූපික, නිෂ්ඨා වශයෙන් හේතු වර්ග හතරක් ඇත. සෑම වස්තුවකම විකසිත භාවයට මෙම හේතු හතර අවශ්‍ය වේ. සචේතනික වස්තූන් වල පමණක් නොව අචේතනික ස්වභාවධර්මයේ ක්‍රියාකාරිත්වය තුළ ද මෙම හේතු ක්‍රියාවලිය දැක ගත හැකිය.

උදාහරණ වශයෙන් මනාව නිපදවන ලද රන් මාලයක් ගත් විට එහි ද්‍රව්‍ය හේතුව වන්නේ එහි පවත්නා රත්‍රන්ය. එයට හේතුව රත්‍රන් වලින් මාලය නිපදවා ඇති හෙයිනි. එහි මාලය බවට පත් වන්නේ කලින් පැවති අමුද්‍රව්‍යයි. මෙම අමු රන් මාලය සාදන්නාගේ උත්සාහය නිසා මාලයක් බවට පත් වේ. එබැවින් මාලය සාදන්නා මෙහි කාරකය බවට පත් වේ. රූපික හේතුව බවට පත් වන්නේ මාලයේ රූපයයි. නිෂ්ඨා හේතුව වන්නේ සැබෑ මාලයයි. එනම් සියලු ක්‍රියාවලීන්ගේ සම්පූර්ණත්වය ලබන්නා වූ අවසාන ප්‍රතිඵලයයි.

ඇරිස්ටෝටල් දක්වන ආකාරයට ඔහුට පෙර සිටි ග්‍රීක දාර්ශනිකයන්ට මෙම හේතුව පිළිබඳව අවබෝධයක් නොතිබුනු බැවින් ග්‍රීක දාර්ශනය උසස් බවට ගෙන ඒමට ඔවුන්ට නොහැකි වී තිබේ. එහෙත් තමාට පෙර සිටි හෙරක්ලීටස්, තේල්ස් මෙම හේතුව පිළිබඳ ව දැන සිටි බව ඇරිස්ටෝටල් විසින් පිළිගත්ත ද එය සම්පූර්ණත්වයට පත් කළේ තමා විසින් යැයි දක්වා තිබේ. අනතුරුව ඇරිස්ටෝටල් දැක්වූ හේතුන් හතර ඔහු විසින් නැවතත් හේතුන් දෙකකට දක්වා තිබේ. එනම් ආකෘති හා ද්‍රව්‍ය වශයෙනි. එබැවින් මොහුගේ දර්ශනය ආකෘතිය සහ ද්‍රව්‍ය පිළිබඳ දර්ශනය වශයෙන් ද හඳුන්වා තිබේ. ආකෘතිය යනුවෙන් ඔහු අදහස් කළේ කිසියම් වස්තුවක අවසාන හරයයි. ඔහු දක්වන ආකාරයට සෑම ද්‍රව්‍ය වස්තුවකම අවසාන ඉලක්කය වනුයේ ආකෘතිය සාක්ෂාත් කිරීමයි. එහෙත් ප්ලේටෝ මෙන් ඇරිස්ටෝටල් ආකෘතිය යන්න ද්‍රව්‍යයෙන් වෙන් කොට වෙනම යථාර්ථයක් වශයෙන් ඉදිරිපත් කළේ නැත. ඔහුගේ ආකෘතිය වනාහි ද්‍රව්‍යක් සමග අන්‍යෝන්‍ය වශයෙන් බැඳි පවතින්නකි. එසේම ඔහුගේ ආකෘතිය පිළිබඳ සංල්පය ප්ලේටෝ මෙන් සදාතනික වූවක් නොව වෙනස් වන විපරිණාමයට පත්වන ස්වභාවක් දරන්නකි.

ඉහත දක්වන ලද්දේ සොක්‍රටීස්, ප්ලේටෝ හා ඇරිස්ටෝටල් යන ග්‍රීක දාර්ශනිකයින් තිදෙනා ඥාන විභාගය සම්බන්ධයෙන් දක්වන ලද අදහස්ය. ආරම්භයේ සිටම ග්‍රීක දාර්ශනිකයින් විශ්වයේ යථාර්ථයන් සෙවීමට උත්සාහ ගත් අතර සොක්‍රටීස් එය වෙනස්කොට මිනිසා පිළිබඳ යථාර්ථයන් සෙවීමට දර්ශනය යොදා ගත්තේය. ඥානය, සදාචාරය, මරණය, පුනරුප්පත්තිය වැනි මාතෘකා ඔස්සේ ස්වකීය ඉගැන්වීම් මෙහෙය වූ සොක්‍රටීස් කිසියම් වාස්තවික පදනමක සිට තම දර්ශනය ඉදිරිපත් කිරීමට සමත් විය. මෙය තවදුරටත් ඉදිරියට ගෙන ගිය ප්ලේටෝ 'ආකෘති' නැමති සංකල්පය ඔස්සේ මිනිස් අත්දැකීම්



ඉක්මවා ඥානය පිළිබඳ කිසියම් විග්‍රහයක් කිරීමට උත්සාහ ගත්තේය. එහෙත් මෙම සංකල්පය විවේචනය කළ ඇරිස්ටොටල් නැවතත් වාස්තවික තලයක සිට දාර්ශනිකව කරුණු ඉදිපත් කළ අයුරක් දැක ගත හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

කලන්සූරිය, ඒ. ඩී. පී., *ග්‍රීක දර්ශනය*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2007.

John M. Cooper, ed., *Complete Works*, by Plato, Indianapolis: Hackett, 1997.

John Burnet, *Greek Philosophy: Thales to Plato*, 3rd ed., London: A & C Black Ltd., 1920.

Laurence Lampert, *How Philosophy Became Socratic*, Chicago: University of Chicago Press, 2010.